# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2025/23 - 2017 ජුනි මස 28 වැනි බදාදා - 2017.06.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, ගම්පහ, අත්තනගල්ල-මිනුවන්ගොඩ පානීය ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ඉදිකරනු ලබන බස්නාගොඩ ජලාශයට යටවන ඉඩමෙහි පදිංචිකරුවන් නැවත පදිංචි කිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගෙන රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් වෙත භාරදීමට අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2017 ජුනි මස 07 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1288

**උපලේඛනය**

කෑගල්ල දිස්ත්‍රික්කයේ, රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 101C වහකුල ග්‍රාම නිලධාරී වසමේ සනික්‍රොප්ට් වත්ත ගමේ පිහිටි සනික්‍රොප්ට් වත්ත අංක 2 කොටස නමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් අක්කර 24, පර්චස් 39.3 පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

*උතුරට* : සනික්‍රොප්ට් වත්ත ඉතිරි කොටස ;
*නැගෙනහිරට* : සනික්‍රොප්ට් වත්ත ඉතිරි කොටස ;
*දකුණට* : සනික්‍රොප්ට් වත්ත ඉතිරි කොටස ;
*බටහිරට* : ඇල මාර්ගය (බස්නාගොඩ ඔයට සම්බන්ධ අතුරු ඇල මාර්ගය).

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 01. ප්‍රධාන විධායක නිලධාරී,
සීමාසහිත මල්වත්ත වැවිලි සමාගම,
අංක 280, ඩැම් වීදිය,
කොළඹ 12.

07 -350

1A - G 25808— 18 (2017/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*